# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2179/8 - 2020 ජුනි මස 09 වැනි අඟහරුවාදා - 2020.06.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : BD/HE/LND/05/64.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2017/LO/57.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර* :

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවිනි කෝරලයේ 55 ඇටම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ මැනුම්පති විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 197 අතිරේකය 33 පත්‍ර අංක 38 කැබලි අංක 955 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණය හෙක්. 0.0051 ක් පමණ වන දියබොලතැන්න වත්ත නැමති ඉඩම් කොටසට මායිම්.

| | |
|---|---|
| උතුරට | : කැබලි අංක 887, 888 සහ 9 |
| නැගෙනහිරට | : මාර්ගය (ප්‍රාදේශීය සභා) |
| දකුණට | : මාර්ගය (ප්‍රාදේශීය සභා) හා කැබලි අංක 9 |
| බස්නාහිරට | : කැබලි අංක 9 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුම දෙනා තම තමන්ම හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි, ඒ ඒ ඉඩම් කැබලි සඳහා පහත නියම කර ඇති වේලාවට හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

| *පරීක්ෂණ දිනය* | *වේලාව* | *කැබලි අංක* |
|---|---|---|
| 2020.06.30 | පෙ.ව. 10.00 | 955 |

තව ද 2020.06.24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය එකී ඉඩම ලබා ගැනීමට හා වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයක් වන්දි මුදල හා ඒ මුදල ගණන් බලන ලද ආකාරය මා වෙත පිටපත් 02 සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එච්. පී. ඒ. ජී. අනුරුද්ධ,
ප්‍රාදේශීය ලේකම්,
හාලිඇල.

2020 මැයි මස 21 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.


1A - G 32149 – 22 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*